# Abstract 43

## ජපානයේ සෙන් දහම මගින් අධ්‍යාපනයට සිදුවූ බලපෑම

**ඒ. එම්. ප්‍රසාදි අප්සරා අදිකාරම්, ඩී. ජී. ඩී. පී. එස්. ප්‍රේමරත්න,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර - බෞද්ධ සංස්කෘතිය),
*apsaraprasadi89@gmail.com, devindaprabhathsri@gmail.com*

නැගෙනහිර ආසියාවේ පිහිටි දූපත් රාජ්‍යයක් වන ජපානය ජාතියක් ලෙස සංවර්ධනය වූයේ බුදුදහම ලැබීමෙන් අනතුරුව ය. **හෙයියන්** යුගයේ බුදුදහම ජනතාව අතරට පත්වීම ඇරඹීමත් බෞද්ධ භික්ෂූන්ගේ මූලිකත්වයෙන් **කන** (හිරගන/කටගන) අක්ෂර මාලාව නිර්මාණය කර ගැනීමත් හරහා බෞද්ධ අධ්‍යාපනය ජපන් පොදුජන සමාජයට ප්‍රවිෂ්ට විය. බුදුදහම ලැබීමෙන් සියවස් කීපයකට පසු ජපානයට සෙන් (Zen) බුදුදහම ප්‍රවේශ විය. සෙන් දහමේ පදනම භාවනාව යි. ජන ජීවිතය හා බැඳි සෙන් දහම ප්‍රඥා ප්‍රතිලාභය පමණක් අරමුණු කර නො ගත්තකි. ජපන් ජන ජීවිතය සමඟ තදින් බැඳී ඇති සෙන් දහම මගින් අධ්‍යාපනයට බලපෑමක් කරයි නම්, ඒ කුමන ආකාරයේ බලපෑමක් ද යන්න පිරික්සීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. රාජකීය බලවතුන්ට පමණක් සීමා වී පැවති අධ්‍යාපනය, බුදුදහම ලැබීමෙන් පසු ජනතාව අතරට යාම නිසා සියල්ලන්ට ම විවෘත විය. මෙසේ බිහිවූ අධ්‍යාපනය ජපන් ජනයාගේ බාහිර හා ආධ්‍යාත්මික, චර්යාමය පෝෂණය සඳහා බෙහෙවින් බලපෑවේ ය. ජපන් බෞද්ධ අධ්‍යාපන රටාව වෙනස් මගකට යොමු කරමින් ජනතාවට භෞතික හා ආධ්‍යාත්මික අංශයන් නියෝජනය වන සේ අධ්‍යාපන රටාවක් බිහි කළේ සෙන්වාදී භික්ෂූන් ය. ආධ්‍යාත්මික සහ භෞතික සංවර්ධනය විෂයයෙහි ද සෙන් දහමෙන් බලපෑමක් සිදුවූ අතර සෙන් අධ්‍යාපන ආයතන මඟින් ලෞකික විෂය ධාරාවන් රැසකින් පුළුල් දැනුමක් ලබාදුන් බැවින් වසරක් පාසා විද්වතුහු රාශියක් බිහි වූහ. සංයමය, කැපවීම, විනය, සරල පැවැත්ම, සුභවාදී චින්තනය, ඉවසීම, උත්සාහය ආදී ගුණාංග රාශියක් සෙන් බුදුදහම මඟින් ජපන් ජනයාට උරුම විය. මේ අයුරින් අභ්‍යන්තර ගුණාංග වර්ධනය කරමින් අධ්‍යාපනය ඇතුළු සකලවිධ සංස්කෘතිකාංගයන් බෞද්ධ ආධ්‍යාත්මික සුවය ගැබ්වුණු ඒවා බවට පත්කරමින් ජපානය නවමු මාර්ගයකට යොමු කරවීමේ බලවේගය වූයේ පොදු ජන ආගම බවට පත්වූ සෙන් බුදුදහම බව පෙනේ.

ප්‍රමුඛ පද : ආධ්‍යාත්මික සංවර්ධනය, ජන ජීවිතය, ජපානය, භෞතික සංවර්ධනය, සෙන් බුදුදහම